කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)- 2021

2024 - අගෝස්තු

**BCOME 4015 - උපායමාර්ගික කළමනාකරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : (හයයි ) 06 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්න අංක - 01

මධ්‍යම ප්‍රමාණයේ හෝටල් ජාලයක් වන සිරිලක් රිසෝර්ට් ආයතනයට, කොවිඩ් 19 වසංගතය හේතුවෙන්, වැඩිවන තරඟකාරීත්වයට සහ සැලකිය යුතු ආදායම් අහිමිවීම් වලට මුහුණ දීමට සිදුවී ඇත. මේ හේතුවෙන්, ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී ප්‍රියා ප්‍රනාන්දු මහත්මිය, වෙළඳපල තත්ත්වය නැවත අත්පත් කර ගැනීමට සහ දිගුකාලීන වර්ධනය සහතික කිරීම වෙනුවෙන් නව උපාය මාර්ග ගවේෂණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමඟ රැස්වීමක් කැඳවා ඇත. මෙම අභියෝගවලට මුහුණ දීමට සහ නව කලාපවලට ව්‍යාප්ත වීමට සමාගම දිගුකාලීනව සැලසුම් කළ යුතු බව ඇය විශ්වාස කරයි.

අ. උපායමාර්ගික කළමනාකරණය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න නිර්වචනය කරමින්, උපායමාර්ගික කළමනාකරණ ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ. උපායමාර්ගික කළමණාකරණයේ යෙදීමෙන් බොහෝ ප්‍රයෝජන ඇත. නමුත් බොහෝ සංවිධාන තවමත් අසාර්ථක වේ. සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 02

"සමාගමක දැක්ම යනු එහි ගමනට මඟ පෙන්වන ආලෝකය වන අතර, එය යා යුත්තේ කොතැනටද යන්න සහ එම ගමනේදී ඇති කරන බලපෑම එමගින් විදහා දැක්වේ."

අ. දැක්ම, මෙහෙවර සහ අරමුණු අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරමින්, ආයතනික අරමුණු වල ලක්ෂණ ලැයිස්තුගත කරන්න.

(ලකුණු 08)

ආ. ඇන්සොෆ් න්‍යායය මත පදනම්ව විවිධ ආකාරයේ උපායමාර්ග පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 03

කාබනික ආහාර නිෂ්පාදිත සමාගමක් වන ග්‍රීන්ලීෆ් ඕගනික්ස් සමාගම විශ්වාසවන්ත පාරිභෝගික පදනමක් ගොඩනගා ගෙන සිටි නමුත් මේ වනවිට, වෙළඳපොළ තරඟකාරීත්වය වැඩිවීම, අමුද්‍රව්‍ය පිරිවැය උච්ඡාවචනය වීම සහ සැපයුම් දාමයේ බාධා වැනි අභියෝගවලට මුහුණ දී සිටී. කාබනික වෙළඳපොළට පිවිසෙන විශාල සුපිරි වෙළඳසැල් දාමයන් ඔවුන්ගේ වෙළඳපල කොටසට තර්ජනයක් වේ. මෙම ගැටළු විසඳීම සඳහා, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය ශදූඅත විශ්ලේෂණයක් කිරීමට සහ, සමාගමට එහි තරඟකාරිත්වය පවත්වා ගැනීමට උපකාරී වන උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා පෝටර්ගේ බල පහේ ආකෘතිය භාවිතා කරමින් තක්සේරුවක් සකස් කිරීමට තීරණය කොට ඇත.

අ. උක්ත සංවිධානය සඳහා ශදූඅත විශ්ලේෂණයක් ගොඩනගන්න.

(ලකුණු 08)

ආ. පෝටර්ගේ බලවේග පහට අදාළව උපාය මාර්ගික කළමනාකරණයේ දී තරඟකාරී විශ්ලේෂණයේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 04

අ. ඔබට ගත හැකි උපාය මාර්ගික තීරණවල විවිධ මට්ටම් මොනවාද? එවැනි එක් එක් මට්ටම පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ. BCG න්‍යාස මගින්, සමාගම්වලට ඔවුන්ගේ වර්තමාන වෙළඳපල තත්ත්වය තක්සේරු කිරීමට සහ දිගුකාලීන වර්ධනය සහ ලාභදායීත්වය සඳහා ඔවුන්ගේ අවධානය යොමු කළ යුතු ස්ථානයන් පිළිබඳව වඩාත් හොඳ තීරණ ගැනීමට බලවත් රාමුවක් සපයයි.

BCG න්‍යාසය භාවිතා කරමින්, සංවිධානයකට ඔවුන්ගේ ව්‍යාපාර මට්ටමේ උපාය මාර්ගයක් තෝරා ගත හැකි ආකාරය විස්තර කරන්න?

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 05

අ. උපාය මාර්ග ඇගයීම සහ පාලන ක්‍රියාවලිය විස්තර කරන්න.

(ලකුණු 08)

ආ. උපාය මාර්ග ඇගයීම සහ පාලනය සඳහා සමබර ලකුණු පත්‍රය භාවිතා කළ හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 12)
(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 06

පහත සඳහන් ඕනෑම දෙකක් ගැන කෙටි සටහන් ලියන්න.

i. PESTLE විශ්ලේෂණය
ii. අභ්‍යන්තර විගණනය
iii. පෝටර්ගේ පොදු උපායමාර්ග (Porter's Generic Strategies )
iv. උපායමාර්ග ක්‍රියාවට නැංවීමේදී භාවිතා කරන ප්‍රතිපත්ති

(ලකුණු 10 x 2)
(මුළු ලකුණු 20)